# ධර්මාවබෝධයට ප්‍රත්‍යවේක්ෂාවෙහි උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක්

**බළන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි**[1]

## හැඳින්වීම

බෞද්ධ ඉගැන්වීම් අනුව සෑම භික්ෂුවක් ම දෛනිකව ප්‍රත්‍යවේක්ෂා වැඩිය යුතු ය. විශේෂයෙන් මෙය සිව්පසය පරිභෝජනය සමග සිදුකළ යුතු සතිමත්භාවයෙන් යුක්ත ප්‍රායෝගික භාවනාවක් වශයෙන් ද හැඳින්විය හැක. මෙහි දී අනිත්‍ය දුක්ඛ අනාත්ම යන මූලික ධර්මයන් අවබෝධ කර ගැනීමට උපකාර කරගත හැකි බව හඳුනාගත හැකි ය. ඒ අනුව චීවර, පිණ්ඩපාත, සේනාසන හා ගිලානප්‍රත්‍යය යන සතර ප්‍රත්‍යයන් යෝනිසෝමනසිකාරයෙන් යුතු ව බ්‍රහ්මචාරී ප්‍රතිපදාව සඳහා උපකාරීවන අයුරින් පමණක් පරිභෝග කිරීම ගෞරවනීය පරිභෝගයකි. ඒ අනුව ප්‍රත්‍යවේක්ෂාවෙන් ධර්මාවබෝධය සිදු කරගන්නේ කෙසේ දැයි විමසීම මෙම පර්යේෂණයේ අරමුණයි.

## පර්යේෂණ ගැටලුව

ප්‍රත්‍යවේක්ෂා යන වචනාර්ථය ඉක්මවා ගිය අවබෝධාත්මක ඵලදායිතාවක් මෙහි දක්නට ලැබේ ද? එසේනම් එම අවබෝධය ළඟා කරගත හැක්කේ කෙසේ දැයි විමසීම මෙහි පර්යේෂණ ගැටලුව යි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ග්‍රන්ථ සන්ධාර විශ්ලේෂණය ඔස්සේ සිදුකෙරෙන්නකි. භික්ෂුව විසින් දෛනිකව පුහුණු කළයුතු ප්‍රත්‍යවේක්ෂාවේ කරුණු ආශ්‍රයෙන් සම්පූර්ණ කෙරේ. මෙහිදී වර්තමාන ප්‍රත්‍යවේක්ෂාව මෙන් ම අතීත ප්‍රත්‍යවේක්ෂාව කෙරෙහි පර්යේෂකයා විශේෂ අවධානයක් යොමු කරයි. ශුද්ධාෂ්ඨක ධාතු මාත්‍රය, නිස්සත්ව, නිජ්ජීව, ශූන්‍ය යන වචනාර්ථයන් ගෙන් අපේක්ෂිත අර්ථ විශේෂ විමර්ශනයට ලක් කෙරේ. මෙම ක්‍රමවේදය අනුගමනය කරමින් ත්‍රිලක්ෂණාවබෝධය ප්‍රත්‍යවේක්ෂාව තුළින් ලබා ගත හැකි දැයි විමර්ශනය කිරීම මෙම පර්යේෂණ ක්‍රමවේදය යි.

## පර්යේෂණ අරමුණු

ගාම්භීරාර්ථ ගවේෂණය කිරීම ප්‍රධාන අරමුණයි. මෙයින් වත්මන් භික්ෂුවගේ ආධ්‍යාත්මික ප්‍රවනතාවන් වර්ධනය කිරීමට මගපෙන්වීමද අතිරේක අරමුණකි.

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යවහාරික බෞද්ධ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. chandrakeerthi@busl.ac.lk

**පර්යේෂණයේ වැදගත්කම**

මෙම පර්යේෂණයෙන් භික්ෂූන් වහන්සේලාගේ විශේෂ අවධානයක් යොමු නොවුණු පැතිකඩක් විවර වනු ඇත. විදර්ශනා භාවනාව චක්‍රාකාරයකින් ප්‍රත්‍යවේක්ෂා වැඩීමෙන් සම්පූර්ණ කර ගැනීමට උපකාර වනු ඇත. භික්ෂුව දෛනික ප්‍රත්‍යවේක්ෂා වැඩියයුතු හෙයින් එමගින් නොකඩවා විදර්ශනා ප්‍රගුණ කිරීමක් ද සිදු වේ. තව ද නව පර්යේෂණයන් කෙරෙහි දොරටු විවරකර දීමක් වශයෙන්ද මෙම පර්යේෂණය වැදගත්වනු ඇත.

**පූර්ව සාහිත්‍ය විමර්ශනය**

මජ්ඣිම නිකායේ පළමු පණ්ණාසකයෙහි සබ්බාසව සූත්‍රයෙහිද, අංගුත්තර නිකායෙහි හයවෙනි කොටසෙහිද, සමන්තපාසාදිකාවෙහිද මේ පිළිබඳ ව දැක් වේ. මේ පිළිබඳ සූත්‍ර දේශනාවන්හි තොරතුරු දැක් වේ. ධාතුවසෙන චාති ''යථාපච්චයං වත්තමානං ධාතුමත්තමෙවෙතං, යනුවෙන් විසුද්ධිමග්ග ටීකාවෙහි සීලනිද්දේසයෙහි ප්‍රත්‍යවේක්ෂා පිළිබඳ විස්තරයක් දක්වා ඇත. තව ද අතීත ප්‍රත්‍යවේක්ෂාව පිළිබඳ විසුද්ධි මාර්ගයෙහි සීලනිද්දේසයේ ද සඳහන් ව ඇත. රේරුකානේ චන්දවිමල ස්වාමීන් වහන්සේ විසින් රචිත ශාසනාවතරණයෙහි ද මෙම ප්‍රත්‍යවේක්ෂාවන් පිළිබඳ ව සාකච්ඡා කොට ඇත. ''ධාතු වශයෙන් හා ප්‍රතිකූල වශයෙන් කරන ප්‍රත්‍යවේක්ෂාවෙන් බොහෝ කෙළෙස් දුරු වේ. විදර්ශනා වඩන යෝගාවචරයනට එය ඉතා ප්‍රයෝජනවත්ය. බොහෝ පැවිද්දනට ශ්‍රමණ අදහස් නැතිවී ගිහි අදහස් ඇතිවන්නේ, තෘෂ්ණා මානාදි කෙළෙස් අධික වන්නේ, බොහෝ ප්‍රත්‍යය සොයන්නට රැස් කරන්නට සිත් වන්නේ, මිල මුදල් සපයන්නට සිත් වන්නේ, පැවිද්දනට නුසුදුසු ක්‍රමවලින් ප්‍රත්‍ය සපයන්නට සිත් වන්නේ ප්‍රත්‍යවේක්ෂාවෙන් තොරව සිවුපසය පරිභෝග කිරීමෙනි. ශ්‍රමණ ගුණ, ශ්‍රමණ අදහස් ඇති වීමට, තහවුරු වීමට බලවත් හේතුවක් වන දෙය මේ ප්‍රත්‍යවේක්ෂාවය''. රේරුකානේ චන්දවිමල ස්වාමීන් වහන්සේගේ ශාසනාවතරණය නම් ග්‍රන්ථය මේ පිළිබඳ ප්‍රමාණවත් මූලාශ්‍රයකි.

**සාකච්ඡාව**

ධර්ම අවබෝධය පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී සත්ව පුද්ගල ආදී වශයෙන් සලකා නොගෙන අනිත්‍ය දුක්ඛ අනත්ත ලෙසින් ත්‍රිලක්ෂණ අවබෝධය ලබාගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ බව සබ්බේ සංඛාරා අනිච්චාති..., සබ්බේ සංඛාරා දුක්ඛාති..., සබ්බේ ධම්මා අනත්තාති..., යනුවෙන් ධම්මපදයෙහි යෝගාවචරයා සිහි කළයුතු ආකාරය දක්වා ඇත. ඒ අනුව වර්තමාන ප්‍රත්‍යවේක්ෂා සහ අතීත ප්‍රත්‍යවේක්ෂාව තුළින් අපේක්ෂා කරනුයේ අප්පිච්ඡතා සන්තුට්ඨිතා ආදි උතුම් ගුණදහම් භික්ෂුවගේ සන්තානයෙහි ඇති කරවීමයි. එතුළින් ලෝකාමිෂය කෙරෙහි පවත්නා බන්ධනයන් සිඳ බොජ්ඣංග ධර්ම අවබෝධය සඳහා මග හෙළිකරනු ඇත.

මෙම කරුණු වර්ධනය කරගැනීම සඳහා සතිමත් භාවයෙන් යුතු භික්ෂුව නිරන්තරයෙන් වර්තමාන ප්‍රත්‍යවේක්ෂාවෙහි යෙදෙමින් සිව්පසය පරිභෝග කළයුතු බව මජ්ඣිම නිකායෙහි සබ්බාසව සූත්‍රයෙහි පටිසේවනා පහාතබ්බා යන්නෙන් දක්වා ඇත. ඒ අනුව ප්‍රත්‍යවේක්ෂාවෙන් දුරු කළයුතු කෙළෙස් ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් ම දුරුකළයුතු

ය. මෙය කෙළෙස් දුරුකරන සප්තවිධ ක්‍රමවේදයෙහි තෙවැනි ක්‍රමවේදයයි. ඊට අදාළව චීවර පිළිබඳ තෘෂ්ණාව, ආහාර පිළිබඳ තෘෂ්ණාව, සෙනසුන් පිළිබඳ තෘෂ්ණාව සහ ගිලානප්පච්චය පිළිබඳ තෘෂ්ණාව ද සංසාරය කෙරෙහි භික්ෂුවගේ සිත බැඳ තබන බන්ධනයන් වශයෙන් සැලකිය යුතු ය.

පටිසංඛායෝනිසො චීවරං පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය..., වශයෙන් චීවර ප්‍රත්‍යවේක්ෂාවද පටිසංඛායෝනිසො පිණ්ඩපාතං පටිසෙවාමි, නෙව දවාය, න මදාය, න මණ්ඩනාය..., වශයෙන් පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාවද පටිසංඛායෝනිසො සේනාසනං පටිසෙවාමි..., යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං..., වශයෙන් සේනාසන ප්‍රත්‍යවේක්ෂාවද පටිසංඛායෝනිසො ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං පටිසෙවාමි..., යාවදෙව උප්පන්නානං වෙයාබාධිකානං වෙදනානං පටිඝාතාය..., වශයෙන් ගිලානප්‍රත්‍යය ප්‍රත්‍යවේක්ෂාවද වර්තමාන ප්‍රත්‍යවේක්ෂා වශයෙන් දැක් වේ. මේ තුළින් ශාසන බ්‍රහ්ම චර්යාවේ යෙදෙන භික්ෂුවගේ සිත විදර්ශනා මාර්ගයට යොමු කිරීමට විශාල පිටුබලයක් සපයයි.

තව ද අතීත ප්‍රත්‍යවේක්ෂාව පිළිබඳ ව අවදානය යොමු කිරීමේ දී අනිත්‍ය දුක්ඛ අනාත්ම කරුණු වඩාත් ප්‍රකටව හඳුනාගැනීම පහසු කරවයි.

යථා පච්චයං පවත්තමානං ධාතු මත්ත මෙවෙතං යදිදං චීවරං තදුපභුඤ්ජකොච පුග්ගලො ධාතුමත්තකො නිස්සත්තො නිජ්ජීවො සුඤ්ඤො සබ්බානි පන ඉමානි චීවරානි අජිගුච්ඡනීයානි ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයා නි ජායන්ති.

මෙම චීවර ප්‍රත්‍යවේක්ෂා කොටසෙහි දැක්වෙන තද අකුරින් දක්වා ඇති වචන විශේෂ අවධානයට ලක් කෙරේ, පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජස් යන ශුද්ධ අෂ්ටක ධාතු මාත්‍රයකින් මේ ලෝකයේ ජීවි, අජීවි සියලු දෙය සකස් වී ඇති බව ප්‍රකාශ කෙරේ. තව ද මෙම චීවරය සහ එය පරිහරණය කරන පුද්ගලයාද ඉහත දැක්වූ ධාතු කොටස්වලින් සැකසී ඇත. මෙම පුද්ගලයා සත්වයෙක් නොවූ, ජීවියෙක් නොවූ ශූන්‍ය වූ ශුද්ධ අෂ්ඨක ධාතු මාත්‍රයක් බවද ප්‍රකට කෙරේ. එසේ වුවත් අතිශයින් පිළිකුල් කටයුතු වූ මෙම කුණප කොට්ඨාශයන්ගෙන් යුක්ත ශරීරය කරා පැමිණි චීවරය අතිශයින් පිළිකුල් කටයුතු වූ තත්වයට පැමිණෙන බව මෙම පාලි පාඨයෙන් ප්‍රකාශිතය. මේ තුළින් අනිත්‍ය, දුක්ඛ, අනත්ත යන පදයන්හි අර්ථ ලබාදෙන ස්ථාන හඳුනා ගැනීමෙන් මෙම පර්යේෂණය සම්පූර්ණ කෙරේ. මේ ආකාරයෙන් චීවර ප්‍රත්‍යවේක්ෂාව, පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව, සේනාසන ප්‍රත්‍යවේක්ෂාව සහ ගිලානප්‍රත්‍ය ප්‍රත්‍යවේක්ෂාව යන සිව් ප්‍රත්‍යවේක්ෂාවන් කෙරෙහිම විශේෂ අවධානය යොමු කළ යුතු ය.

චීවර ප්‍රත්‍යවේක්ෂාව තුළ අනිත්‍යභාවය හැඟවෙන පද වශයෙන් යදිදං චීවරං ධාතුමත්තං, තං උපභුඤ්ජකො ච පුග්ගලො ධාතුමත්තකො..., පර්යේෂකයා හඳුනාග නී. දුක්ඛභාවය හැඟවෙන පද වශයෙන් ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයානි ජායන්ති. යන පද පර්යේෂකයා හඳුනාගනී. අනත්තභාවය හැඟවෙන පද වශයෙන් ධාතුමත්තකො, නිස්සත්තො, නිජ්ජීවො, සුඤ්ඤෝ යන පද පර්යේෂකයා හඳුනාගනී.

මෙයින් විදර්ශනා යෝගාවචරයාට ධාතු වශයෙන් සහ පටික්කුල වශයෙන් මේ ශරීරයෙහි ඇති නිස්සාරත්වය අවබෝධ කරගැනීමට පහසුවනු ඇත. එසේ ම පුහුදුන්

පුද්ගලයන් වශයෙන් තෘෂ්ණා දෘෂ්ටියෙන් යුතුව බැඳෙන පංචකාමයන් කෙරෙන් මිදීම සඳහා නිරතුරුව ප්‍රත්‍යවේක්ෂාවෙහි පිහිටා කටයුතු කිරීම නිර්වාණගාමී මාර්ගය හෙළිකර ගැනීමක් වන්නේ ය.

**නිගමනය**

ධර්ම අවබෝධය, නිර්වාණ අවබෝධය, සත්‍ය අවබෝධය යනුවෙන් සියලු කෙළෙස් ප්‍රහීණ කිරීම හැඳින්වේ. මේ සඳහා කදිම ඔසුවක් වශයෙන් වර්තමාන ප්‍රත්‍යවේක්ෂාව සහ අතීත ප්‍රත්‍යවේක්ෂාව හැඳින්විය හැකි ය. තථාගතයන් වහන්සේ පස්වෙනි පාරාජිකාවක් නම් කළහොත් එය ප්‍රත්‍යවේක්ෂාව සම්බන්ධයෙන් පනවනු ඇතැයි ස්ථවිරවාදි භික්ෂූන් අනුමාන කොට ඇත. ප්‍රත්‍යවේක්ෂාව නොකරන භික්ෂුව සොර පරිභෝගය හෙවත් ඉණ පරිභෝගයට අසුවන බව ධර්මයෙහි දැක් වේ. අයෝනිසෝ මනසිකාරය දුරුකරගැනීමට ද තෘෂ්ණා දෘෂ්ටිය බිඳ සසරෙහි නිස්සාරත්වය වටහා ගැනීමට ද ප්‍රත්‍යවේක්ෂා වැඩීම මහෝපකාරී වනබව දැක්වීම සඳහා සාධක රාශියක් ඇත. අනිත්‍ය පිළිබඳ දැක්වෙන කරුණු අවබෝධ කරගැනීමට සහ දුක පිළිබඳ දැක්වෙන කරුණු අවබෝධ කරගැනීමට මෙන් ම අනත්ත භාවය පිළිබඳ දැක්වෙන කරුණු අවබෝධ කරගැනීමට ද ප්‍රත්‍යවේක්ෂාව වැඩීමෙන් භික්ෂුව උත්සුක විය යුතු ය. මේ අනුව ත්‍රිලක්ෂණ අවබෝධයට හේතු භූතවන කරුණු රාශියක් ප්‍රත්‍යවේක්ෂා ධර්මය තුළ සැඟවී පවතින බව හෙළිවනු ඇත. ප්‍රත්‍යවේක්ෂාව යනු අතිරේක විදර්ශනා භාවනාවක් වශයෙන් නව අර්ථකථනයකින් හඳුන්වාදීමට පර්යේෂකයා කැමති වේ.

**මුඛ්‍ය පදඃ** ත්‍රිලක්ෂණය, ධර්මාවබෝධය, ප්‍රත්‍යවේක්ෂාව, යෝනිසෝමනසිකාරය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අංගුත්තර නිකාය*, ඡක්ක නිපාතය. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

චන්ද්‍රවිමල නාහිමි, ආර්. (2010). *ශාසනාවතරණය*, පොකුණුවිටඃ ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය.

*මජ්ඣිම නිකාය*, ප්‍රථම භාගය. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සද්ධාතිස්ස හිමි, බී. (1949). *සන්න සහිත විසුද්ධිමාර්ගය*, කළුතරඃ ස්වාධීන විද්‍යාතිලක යන්ත්‍රාලය.

*සමන්තපාසාදිකා, පාලි අට්ඨකථාව*. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.